# රන්දිගේ සමනල යාළුවෝ



එන්.ඒ.පී. පහන්දි විහංසා කුලසේකර

# රන්දිගේ සමනල යාළුවෝ

එන්.ඒ.පී. පහන්දි විහංසා කුලසේකර
කතෘ

1 වසර A
මහාමායා බාලිකා විදුහල

ISBN : 978-624-208-455-8

# පිදුම

මෙම පොත සැදීමේදී මා හට
මග පෙන්වූ වැරදි අඩුපාඩු
පෙන්වා දුන්

චාමිනි පල්ලියගුරු

ගුරුමෑණියන්ටත්,

මාගේ ආදරණීය
දෙමාපියන්ටත්,

මේ පොත් පිංච

සෙනෙහසින් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරුණන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ''**හෙරණගත්කරණී**'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

පුංචි රන්දිගේ ගෙදර තිබුණේ කඳු ගැටයක් පාමුල. පුංචි රන්දිට තාම වයස අවුරුදු හයයි.



කිසිම කම්මැලිකමක් නැති පුංචි රන්දි හැමදාම උදෙන්ම අවදි වෙලා මුහුණ කට හෝදාගෙන සුදු ඇඳුම් ඇඳගෙන ඉස්කෝලෙට යන්න කලින් බුදුන් වැඳලා, අම්මටයි, තාත්තටයි වැදල තමයි ඉස්කෝලේ යන්නෙ හරිම ආසාවෙන්.



ඒ මොකද දන්නවාද එයා ගෙදර ඉන්නේ තනියම එයාගෙ අම්මයි, තාත්තයි  එක්ක. රන්දිට සෙල්ලම් කරන්න ගෙදර කවුරුත්ම නැහැ. ඉස්කෝලේ ගියාම එයාට යාළුවෝ ගොඩක් ඉන්නවනේ සෙල්ලම් කරන්න. අන්න එකයි.



දවසක් ඉස්කෝලේ ඇරිලා එද්දි ගෙදරට එන පාර ලඟ තිබුණ පුංචි කඳු ගැටයේ ඉදලා සමනල රෑනක් එහාට මෙහාට ඉගිලි ඉගිලි සෙල්ලමක් කරනවා වගේ දැකපු පුංචි රන්දි ඒ දිහා බලාගෙන හිටියෙ හරිම ආසාවෙන්




මෙහෙම ටික වෙලාවක් බලාගෙන ඉද්දී එක පාරටම සමනල්ලු වේගයෙන් ඉගිලිලා යන්න ගියා. එයාලා නොපෙනී කඳු අතරින් ඈතට යනකල් ම බලා ගෙන හිටපු රන්දිට හරිම පාළුවක් දැනුනා.




හෙමින් හෙමින් ගෙදරට ගියපු රන්දි අම්මත් එක්ක මේ ගැන කිව්වේ ඇස් දෙකේ කඳුළුත් පුරෝගෙන අම්මාටත් හරිම දුකයි. එයාගෙ පුංචි දෝනිට සෙල්ලම් කරන්න යාළුවෙක් නැතිවීම ගැන හැමදාමත් එයාගේ අම්මත් හිටියෙ දුකෙන්නේ.



එකපාරට රන්දි අම්මා ගාවට දුවගෙන ඇවිත් ඒ වගේ ලස්සන සමනලයෝ අපේ ගෙදරටත් ගෙන්න ගන්න පුළුවන් නම් මට එයාලත් එක්ක සෙල්ලම් කරන්නත් පුළුවන්නේ. අනේ අම්මේ එයාලාව අපෙ ගෙදරට ගෙන්න ගන්න විදියක් කියන්නකො. පුතේ අපි තාත්තාත් ඉන්න වෙලාවක මල් පිපෙන ගස් ගොඩක් අපේ මේ පාත්තිය තවත් ටිකක් ලොකු කරලා හදාගමු. ඒවගේ මල් පිපුනම පුළුවන් ඔයාට සමනල යාළුවන්ව මල් පැනි බොන්න එන හැටි බලන් ඉන්න. එහෙම කියපු අම්මා රන්දිගෙ ඔළුවත් අතගාලා එතනින් නැගිටලා යන්න ගියා.



රන්දි ඈත කඳු දිහා බලාගෙන කල්පනා කලේ එයාගේ මල් පාත්තිය හදන විදිහයි. ලැබුණු පළවෙනිම නිවාඩු වෙලාවක එයාල මල් පාත්තියෙ වැඩ පටන් ගත්තා. රන්දි යාළුවන්ගෙන් පාට පාට මල් අතු ගොඩක් අරන් ඇවිත් අම්මටත් පුදුමයි. රන්දි හරිම ආසාවෙන් අම්මයි තාත්තයි එක්ක වැඩ කලා. පාත්තිය හදන්න වල් ගලවලා, මල් පැල හදන්න වලවල් කපලා, මල් හදලා හරිම ලස්සනයි.




හවස් වෙද්දි රන්දිට හරිම මහන්සියි. ටික දවසක් ගෙවිලා ගියා හැමදාම වගේ රන්දිට සමනල යාළුවෝ ඈත කඳු අතර එහා මෙහා දුවදුව සෙල්ලම් කරනවා පෙන්වා. ඒ දිහා බලා ඉන්න රන්දි හරිම ආසයි. එත් එයා හැමදාම දුක් වුනා. එයලා ළඟට ගිහින් එයලා එක්ක සෙල්ලම් කරන්න බැරි නිසා. හැමදාම ඉස්කෝලේ යන්න කලින් මල්වලට සාත්තු කරන එක දැන් හොඳටම පුරුදුයි. රන්දි එයා හරිම ආසාවෙන් ඒක කරන්නෙ.



දැන්නම් මල් ගස්වල පොහොට්ටුත් ඇවිත්
එයා සතුටින් දුවගෙන ගියා අම්මා ළඟට
අම්මවත් ඇදගෙන මල් පාත්තිය ළඟට
දුවගෙන ගිහින් එයාගෙ මල්ගස් වල මල්
පිපෙනවා බලලා අම්මටත් හරි සතුටුයි.



දවසක් රන්දි  මිදුලට වෙලා එයාගෙ පාත්තියේ ලස්සන මල් දිහා බලාගෙන හිටියා. එයා දැක්කා මල් පැණි බොන්න ආව සමනල්ලු එයාට හරිම සතුටුයි. රන්දි හෙමින් හෙමින් මල් පාත්තිය දිහාට ඇවිදගෙන ගියා. හැමදාම ඈත ඉඳලා එයාල දිහා බලාගෙන හිටපු රන්දිට එයාගෙ ළඟටම ඇවිත් ඉන්න යාළුවෝ එක්ක කතා කරන්න ඕන වුනා. ''යාළුවනෙ මම ඔයාල එක්ක සෙල්ලම් කරන්න ආසාවෙන් බලාගෙන හිටියෙ. හැමදාම මගෙත් එක්ක සෙල්ලම් කරන්න එන්න. මන් ඔයාල එනකල් බලා ඉන්නවා.'' ඔයාලට ඇති තරම් පැණි බීල බඩ පුරවා ගන්න. එදා ඉඳලා හැමදාම එයාල සතුටින් සෙල්ලම් කලා.



සමාප්තයි

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්